# පටුන


පිටු අංකය

- ආයතනික පාලන ප්‍රකාශනය 02
- පාලක මණ්ඩල සාමාජිකයින් 03
- විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් 04
- අධිකාරි බලතල සමාලෝචනය සහ පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්හි කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා ආයතනික කාර්යභාරය 05-10

අ. අධිකාරි බලතල

ආ. දැක්ම, මෙහෙවර සහ අරමුණු

ඇ. ආයතන යේ උපදේශන සේවාවන් - ඉලක්කගත කණ්ඩායම

ඈ. ව්‍යාපාර සම්බන්ධීකරණය සහ අධීක්ෂණය - ජාතික සහ ජාත්‍යන්තර පුහුණු සහ අධ්‍යයන ආයතන සමග සම්බන්ධතා

ඉ. ආයතනයේ කළමනාකාරිත්ව ව්‍යුහය

ඊ. සහාය කාර්යමණ්ඩල ව්‍යාප්තිය

- 2014 වසරේ සේවක සැලසුම 11
- 2014 වසර තුළ ආයතනයෙහි සමස්ත කාර්ය සාධනය 12-24

අ. ඉංජිනේරු අංශය

ආ. පොදු කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

ඇ. භෞතික සැලසුම් අංශය

ඈ. මූල්‍ය කළමනාකරණ අංශය

ඉ. නීති අංශය

ඊ. පුහුණු අංශය

උ. පර්යේෂණ හා සංවර්ධන අංශය

ඌ. ධාරිතා වර්ධන අංශය

- 2014 වර්ෂයේ මූල්‍ය තොරතුරු 25-38

අ. මූල්‍ය මෙහෙයුම් පිලිබඳ ප්‍රකාශනය

ආ. මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය

ඇ. ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඈ. ශුද්ධ වත්කම් වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශනය

ඉ. ගිණුම්කරණ සටහන්

සමාප්තිය 39-40

විගණන මතය

**1.0.** ආයතනික පාලන ප්‍රකාශනය

| | |
|---|---|
| ආයතන නාමය | : පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය<br>(1999 අංක 31 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපනය කරන ලදී) |
| මෙහෙයුම් අරඹන ලද දිනය | : 15.10.1999 |
| ලියාපදිංචි කාර්යාලය | : අංක. 17, මලලසේකර මාවත,<br>කොළඹ 07. |
| විගණකවරු | : විගණකාධිපති<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| බැංකුකරුවන් | : ලංකා බැංකුව<br>නිදහස් චතුරස්‍ර ශාඛාව<br>කොළඹ 07. |
| විදේශීය සංගම් | : (අ) පොදු රාජ්‍ය මණ්ඩලීය පළාත් පාලන සංසදය (CLGF) |
| දේශීය සංගම් | : අ) ශ්‍රී ලංකා පළාත්පාලන ආයතන සම්මේලනය<br>ආ) ආසියා පදනම - කොළඹ<br>ඇ) කෙයා ඉන්ටනැෂනල් |
| අනුබද්ධිත ව්‍යාපෘති | : (අ). ආපදා ප්‍රත්‍යස්තිථි ව්‍යාපෘතිය |

**2.0.** පාලක සභාව

**නිලබලයෙන් පත් කරනු ලබන සාමාජිකයින් 8 දෙනෙකුගෙන් සහ පත් කරනු ලැබූ සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සමන්විත වන සාමාජිකයින් 13 දෙනෙකුගෙන් පාලක සභාව සමන්විත වේ.**

2.1. නිල බලයෙන් පත් කළ සාමාජිකයින් පහත දැක්වේ,

- ආර්.ඒ.ඒ.කේ රණවක මහතා - සභාපති
  ලේකම් - පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය

- පී. බී. අබේකෝන් මහතා - සාමාජික
  ලේකම් - රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

- විමලසිරි පෙරේරා මහතා - සාමාජික
  ලේකම් - ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම්, අමාත්‍යාංශය

- විජිත් කණුගල මහතා - සාමාජික
  අධ්‍යකෂක සංස්කෘතික සහ කලා දෙපාර්තමේන්තුව

- බී. එම්. යූ. ඩී. බස්නායක මහතා - සාමාජික
  ලේකම්, පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

- ඒ. කේ. සෙනෙවිරත්න මහතා - සාමාජික
  අතිරේක අධ්‍යක්ස ජනරාල්,
  ජාතික අයවැය දෙපාර්තමේන්තුව,
  මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

- මහාචාර්ය ඒ. එස්. පී. අබයරත්න මහත්මිය - සාමාජික
  උපදේශිකා, පේරාදෙනිය විශ්ව විද්‍යාලය

- ආචාර්ය එම්. ඒ. අබදුල් රකීෂ්තු මහතා - සාමාජික
  ස්ථාන භාර වෛද්‍ය නිලධාරී - සෞඛ්‍ය කාර්යාංශය

- ***ඉංජිනේරු එම්. එස් නෂීර් මහතා - සාමාජික
  ගරු පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යවරයාගේ
  සම්බන්ධීකරණ ලේකම්

- එම්. එච්. ඒ සමාද් මහතා - සාමාජික
  ගරු පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යවරයාගේ
  පෞද්ගලික ලේකම්

- අයි. ඒ හමීඩ් මහතා – සාමාජික සහ කැඳවුම්කරු
  අධ්‍යක්ෂක, ප්‍රධාන විධායක නිලධාරී
  ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය

පාලක මණ්ඩලයේ ලේකම්

- නිරංජලා පෙරේරා මිය

**** අයි. ඒ. හමීඩ් මහතා අයහපත් සෞඛ්‍ය තත්වයෙන් පසුවන හෙයින් ඉංජිනෙරු එම්.එස්. නසීර් මහතා 21.08.2014 දින සිට වැඩබලන අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කර තිබේ.*

**3.0.** විගණන සහ කළමනාකරණ කමිටුව

පහත දැක්වෙන සාමාජිකයින් විසින් 2014 වර්ෂයේ විගනන සහ කළමනාකරණ කමිටුවේ කටයුතු වල නිරත වන ලදී..

(අ).ඒ. කේ. සෙනෙවිරත්න මහතා -සභාපති
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

(ආ)ඉංජිනේරු එම්. එස්. නෂීර් මහතා - සාමාජික
ගරු පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගේ
සම්බන්ධීකරන ලේකම්

(ඇ). එම්.එච්.ඒ. සමාද් මහතා - සාමාජික
ගරු පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගේ
පෞද්ගලික ලේකම්

(ඇ).රංජිත් ලියනාරච්චි මහතා - කැඳවුම්කරු
අභ්‍යන්තර විගණක
පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය

බාහිර නිරීක්ෂකයින්

(ඉ). උදේනි පෙරේරා මහත්මිය
විගණන අධිකාරී

විගණන සහ කළමනාකරණ කමිටුවේ ලේකම්

(ඊ). නිරංජලා පෙරේරා මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

## 4.0 අධිකාරි බලතල සහ පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්හි කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා ආයතනයේ භූමිකාව සමාලෝචනය කිරීම

දිවයිනේ පළාත් පාලන ආයතනයන්හි කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා ඉදිරි දැක්මක් අවශ්‍ය වූ වාතාවරණයක් තුළ පළාත්පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය බිහි වන ලදී. මෙම දැක්ම යථාර්ථයක් බවට පරිවර්තනය කරගැනීම සඳහා ඒ පිලිබඳ අධ්‍යයනයක් සිදුකොට නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස 1997 වසරේදී ජනාධිපති කොමිෂන් සභාවක් පත් කරන ලදී. දිවයිනෙහි පළාත් පාලන ක්ෂේත්‍රයේ කාර්යසාධනය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය වෙනුවෙන් මෙහෙවර ඉටුකිරීම සඳහා නව ආයතනයක් බිහි කිරීමේ වැදගත්කම මෙකී ජනාධිපති කොමිෂන් සභාව විසින් අවධාරණය කරන ලදී. ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම සඳහා ඔවුන්ගේ අපේක්ෂාවන් මුදුන්පත් කරදීමට කාර්යක්ෂම හා සතුටුදායක සේවයක් ජනතාවට ලබා දිය හැකි තත්ත්වයේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ඍජුවම දායකත්වය ලබා දිය හැකි ස්වයං බලතල සහිත ස්වාධීන අංශයක් වශයෙන් පළාත් පාලන ක්ෂේත්‍රය අවධානයට ගත යුතු බව මෙම ජනාධිපති කොමිෂන් සභාව විසින් සඳහන් කරන ලදී. එකී ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීමට වඩාත්ම සුදුසු ආයතනය වන්නේ පළාත් පාලන ආයතනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය බව මෙහිදී දරන ලද පොදු මතය විය. මහජනතාවට සමීප, ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක් වශයෙන් මහජනතාව නියෝජනය කරන්නා වූ ආයතනයක් ලෙස කටයුතු කිරීමේ හැකියාව එය සතු විය. මෙම අභිප්‍රායයන් අනුව යමින් 1999 අංක 31 දරන පාර්ලිමේන්තු පනත මගින් පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය පිහිටුවීමට කටයුතු කරන ලදී. එම වසරේම ඔක්තෝබර් මාසයේදී එහි වැඩකටයුතු ආරම්භ කරන ලදී.

මෙම ආයතනයේ මූලික අරමුණ වන්නේ මහජනතාවට කාර්යක්ෂම හා සතුටුදායක සේවාවක් ඉටු කිරීමට හැකිවනු පිණිස පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල කළමනාකරණ හා ආයතනික කාර්යසාධන තත්ත්වයන් වර්ධනය කිරීමයි. 1987 වසරේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද 13 වන සංශෝධනයත් සමගින් පාලන බලතල විමධ්‍යගත කිරීම ආරම්භ විය. පාලන බලය පැවරීමේ අරමුණ නිසි පරිදි සාක්ෂාත් කරගැනීම සඳහාත් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අරමුණු ඉටු කරගැනිම සඳහාත්, පවරන ලද බලය විධිමත් අයුරින් ක්‍රියාවේ යෙදවීම අත්‍යවශ්‍ය කොන්දේසියක් වේ. ඒ අනුව, එමගින් පළාත් සභා මට්ටමෙන් ආයතනික පාලන කාර්යභාරයක් ස්ථාපනය කරනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

ඉහත සඳහන් කළ අන්දමින් පළාත් පාලනය පිලිබඳව ශ්‍රී ලංකා ආයතනය ඇති කර දැනට වර්ෂ දොලහක් (12) ගත වී තිබේ. මෙම කාලසීමාව තුලදී ආයතනය විසින් ක්‍රියාත්මක කළ යුතු සැලසුම් එය විසින් නිසි පරිදි දියත් කර ඇති අතර, එහි පාලක මණ්ඩලයේ මගපෙන්වීම යටතේ ආයතනයේ අරමුණු හා ඉලක්ක ඵලදායී අන්දමින් සංකල්පගත කිරීමට ආයතනය සමත් වී තිබේ. සිය සංකල්පගත ඉලක්ක සහ අරමුණු කෙටි කාලයක් තුළදී සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයට ජාත්‍යන්තර පළාත් පාලන ආයතනවල මෙන්ම දේශීය පුහුණු ආයතනවලද නොමඳ සහාය ලැබී තිබේ. ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ලබා දෙන දායකත්වය, විශේෂයෙන්ම උපදේශන කාර්යමණ්ඩලයේ සහ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ දායකත්වය ආයතනයේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මහෝපාකාරී වී ඇත.

කෙසේ වුවද, විමධ්‍යගත කිරීමේ වැඩපිලිවෙල, විශේෂයෙන්ම එය ක්‍රියාත්මක කිරීමේ කාර්යයේදීත් තරමක් දුරට දුරස්ථ වී ඇති බවක් පෙනේ.

- විමධ්‍යගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, කාර්යක්ෂමතාවය වර්ධනය වන බව සහ ඉක්මනින් සපුරාලිය යුතු හා ප්‍රමුඛතාවය ලබා දිය යුතු සමාජ අවශ්‍යතා ආමන්ත්‍රණය සඳහා සම්පත් බෙදා හැරෙන බව සහතික කිරීම

- විමධ්‍යගත කිරීම තුලින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ලැබෙන්නා වූ ප්‍රතිචාර වර්ධනය කිරීමේ හැකියාව සහ ඉලක්ක කණ්ඩායම්වල අවශ්‍යතාවයන් සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

- දරිද්‍රතාවය අවම කිරීමේදී සහ සංවර්ධන ක්‍රියාකාරකම් තුලදී විමධ්‍යගත කිරීම තුලින් ලැබිය හැකි සඵලදායී තත්ත්වය

- විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පීඩා විඳින ජනතාව හා පුරවැසියන් කෙරෙහි ලබා දෙන ප්‍රමුඛතාවය පිලිබිඹු වන අන්දමින් මෙම මට්ටම් වලදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම

- බිම් මට්ටමේ ජනතාවගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම සඳහා එම ප්‍රජාවන්හි දායකත්වයද ඇතිව තීරණ ගැනීම පිළිබඳව සැලකිලිමත් වීම

ඒ අනුව, සෑම වර්ෂයකදීම ඉලක්කය වනු ඇත්තේ පළාත් පාලන ආයතන කැප වී සිටින්නා වූ පළාත් මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමය කරා යාම සඳහා ඒවාට මග පෙන්වීම සහ ඊට උචිත වන පරිදි පළාත් පාලන ආයතනවල සහ පළාත් සභාවල ශක්‍යතා වර්ධන ක්‍රියාවලීන් හැඩගස්වා ගැනීම වේ.

**4.1.** ආයතනයේ බල වරම

ආයතනයේ ක්‍රමෝපායික සැලසුම්වල සඳහන් කර ඇති පරිදි පහත දැක්වෙන කාර්යභාරයන් ඉටු කිරීම සඳහා වන රාජ්‍ය අංශයේ ආයතනයක් වශයෙන් පළාත් පාලනය සඳහා වන ශ්‍රී ලංකා ආයතනය ඇති කර තිබේ.

- රටේ යහපාලනය සහතික කිරීමේ අරමුණින් පළාත් පාලන ආයතන සහ පළාත් සභාවල සාමාජිකයින් , නිලධාරීන් සහ ඒවාට අනුයුක්තව සේවය කරන අනෙකුත් කාර්යමණ්ඩලය පුහුණු කිරීම සහ නිපුණතාවයන්ගෙන් පරිපූර්ණ සේවක මණ්ඩලයක් එම ආයතනවල ගොඩනැංවීම
- පළාත් පාලන ආයතන සහ පළාත් සභාවල සංවිධානික ව්‍යුහයන් සහ කළමනාකරණ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා උපදේශක සේවාවන් ලබා දීම
- පළාත් පාලන ආයතන සහ පළාත් සභා වල කළමනාකරණ පද්ධතීන් සහ ක්‍රියාවලීන් විශ්ලේෂණාත්මකව ඇගයීම සඳහා අවශ්‍ය වේදිකාවක් ලබාදීම
- කළමනාකරණ සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකවලට සහාය ලබා දීම
- පළාත් පාලනය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සම්පාදනයේදී ගරු ඇමතිතුමාට අවශ්‍ය තොරතුරු ලබා දීම
- පළාත් සභා සහ පළාත් පාලන ආයතන පිළිබඳව වන ග්‍රන්ථ සහ සඟරා ප්‍රකාශනය, තොරතුරු බෙදා හැරීම සහ සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම සඳහා දේශීය සහ විදේශීය ජාල සමග සහයෝගිතාවයෙන් කටයුතු කිරීම

**4.2.** දැක්ම

"පළාත් සභා සහ පළාත් පාලන ක්ෂේත්‍රයේ ඉගෙනුම සම්බන්ධයෙන් අග්‍රස්ථානය හොබවන්නා වූ ජාතික ආයතනය බවට පත්වීම."

**4.3.** මෙහෙවර

"මහජනතාවට කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබා දීමේ අරමුණ ඇතිව පුහුණු, උපදේශක සේවා සහ පර්යේෂණ සහාය ලබාදීම තුලින් උප ජාතික මට්ටමේ පවතින රාජ්‍ය ආයතනවල සාමාජිකයින්ගේ සහ ඒවායේ සේවය කරන නිලධාරින්ගේ ශක්‍යතා වර්ධනය'

**4.4** අභිමතාර්ථ

ඉහත සඳහන් කළ මෙහෙවර පහත දැක්වෙන්නා වූ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යොමු කෙරේ;

1. පළාත් පාලනයෙහි ආයතනික ශක්තිය නංවාලීම පිණිස, පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සමගින් එක්ව කාර්යසාධනය සඳහා අදාළවන්නා වූ වැඩසටහන් සම්පාදනය කිරීම.

2. පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල කාර්යසාධනය වර්ධනය කිරීමට පුහුණු වැඩසටහන් සම්පාදනය සහ එම වැඩසටහන් පැවැත්වීම සඳහා පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක ශක්තිමත් කිරීම මෙන්ම එකී කාර්යයට සහභාගී වීම.

3. පළාත්පාලනයෙහි පාර්ශ්වකරුවන්ට තාක්ෂණික සහ වෙනත් තොරතුරු සපයා දෙමින් පළාත් පාලනය පිළිබඳ සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කිරීම

4. අදාළ ජාතික සහ අන්තර්ජාතික ආයතන සමගින් සම්බන්ධ වෙමින් පළාත් පාලනය පිළිබඳ කේන්ද්‍රිය ආයතනයක් වශයෙන් කටයුතු කිරීම.

5. මානව සම්පත් කළමනාකරණය වර්ධනය, කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීම හා ආයතනික වෙනස්වීම් සඳහා පහසුකම් සැලසීම සම්බන්ධයෙන් වන විශේෂිත සහාය සේවාවන් උප ජාතික මට්ටමේ රාජ්‍ය ආයතන වෙත ලබා දීම .

6. පළාත් පාලන ආයතන සවිබල ගැන්වීම සඳහා පුහුණු, පර්යේෂණ සහ උපදේශන සේවා සැපයිමට හැකිවනු පිණිස පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි කාර්යසාධනය වර්ධනය කිරීම.

**4.5** පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සපයනු ලබන උපදේශක සේවාව **:**

උපදේශක සේවා ලබා දීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් ප්‍රධාන අංශ හතක් (07) පිහිටුවා තිබේ.

අ. ඉංජිනේරු.

ආ. පොදු කළමනාකරණ / මානව සම්පත් සංවර්ධනය

ඇ. භෞතික සැලසුම්

ඈ. මූල්‍ය කළමනාකරණය

ඉ. නෛතික සහ නීති සම්පාදන කටයුතු

ඊ. පර්යේෂණ සහ සංවර්ධන

එ. පුහුණු සහ සංවර්ධන

ආයතනය විසින් සිදුකරනු ලබන පුහුණු, පර්යේෂණ සහ අනෙකුත් වැඩමුළු ආදියෙහි ප්‍රතිලාභීන් වන්නේ පළාත් සභා 9 සහ පළාත් පාලන ආයතන 335 වන අතර, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල නියෝජිතයින් පිළිවෙලින් 418 ක් සහ 4391 ක් සිටිති. ඊට අමතරව, පළාත් පාලන ආයතනවල අපගේ අවධානය යොමුවන්නා වූ කාර්යාල සේවකයින්, ක්ෂේත්‍ර කාර්යමණ්ඩලය සහ විවිධ ශ්‍රේණිවල සේවකයින් 50,000 ක් පමණ සිටිති.

ඉලක්කගත කර ඇති ඒ ඒ කණ්ඩායම් අනිකුත් කණ්ඩායම්වලට වඩා වෙනස්ය. පළාත් සංවර්ධන පුහුණු ඒකක සමගින් අදහස් හුවමාරු කරගෙන අවශ්‍යතාවයන්ට උචිත වන පරිද්දෙන් වැඩසටහන් සහ පුහුණු සැසි සැලසුම් කරනු ලැබේ. පළාත් මට්ටමින් වැඩ සටහන් සැලසුම් කිරීම සම්බන්ධයෙන් ද අප ආයතනය විසින් සහයෝගී කාර්යභාරයක් ඉටු කර ඇත.

2014 වර්ෂයට සැලසුම් කරනු ලැබූ පුහුණුවීම් අවශ්‍යතාවයන්ට අමතරව, 2013 වර්ෂයට නියමිතව තිබූ පුහුණු වැඩසටහන්ද ඉදිරියට ගෙන එමින් 2014 වර්ෂයෙන් සම්පූර්ණ වැඩසටහන් අවශ්‍යතාවය සම්පාදනය කරන ලදී.

**4.6 ඉලක්ක කණ්ඩායම්**

ආයතනය විසින් සිදුකරනු ලබන පුහුණු, පර්යේෂණ සහ අනෙකුත් වැඩමුළු ආදියෙහි ප්‍රතිලාභීන් වන්නේ පළාත් සභා 9 සහ පළාත් පාලන ආයතන 335 වන අතර, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල නියෝජිතයින් පිළිවෙලින් 418 ක් සහ 4391 ක් සිටිති. ඊට අමතරව, පළාත් පාලන ආයතනවල අපගේ අවධානය යොමුවන්නා වූ කාර්යාල සේවකයින්, ක්ෂේත්‍ර කාර්යමණ්ඩලය සහ විවිධ ශ්‍රේණිවල සේවකයින් 50000 ක් පමණ සිටිති.

ඉලක්කගත කර ඇති ඒ ඒ කණ්ඩායම් අනිකුත් කණ්ඩායම්වලට වඩා වෙනස්ය. පළාත් සංවර්ධන පුහුණු ඒකක සමගින් අදහස් හුවමාරු කරගෙන අවශ්‍යතාවයන්ට උචිත වන පරිද්දෙන් වැඩසටහන් සහ පුහුණු සැසි සැලසුම් කරනු ලැබේ. පළාත් මට්ටමින් වැඩ සටහන් සැලසුම් කිරීම සම්බන්ධයෙන් ද අප ආයතනය විසින් සහයෝගී කාර්යභාරයක් ඉටු කර ඇත.

2014 වර්ෂයට සැලසුම් කරනු ලැබූ පුහුණුවීම් අවශ්‍යතාවයන්ට අමතරව, 2013 වර්ෂයට නියමිතව තිබූ පුහුණු වැඩසටහන්ද ඉදිරියට ගෙන එමින් 2014 වර්ෂයෙන් සම්පූර්ණ වැඩසටහන් අවශ්‍යතාවය සම්පාදනය කරන ලදී.

**4.7** සම්බන්ධීකරණය සහ අධීක්ෂණය

පළාත් කළමනාකරණ සංවර්ධන ඒකක මගින් සහ පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් පවත්වනු ලබන පුහුණුවීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම මෙම ආයතනයෙහි වැදගත් කාර්යභාරයක් වශයෙන් සැලකේ. පළාත් කළමනාකරණ සංවර්ධන ඒකකය සහ පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පවත්වනු ලබන මාසික සමාලෝචන රැස්වීම් හරහා මෙම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනයට කටයුතු කරනු ලැබේ.

**4.8** ව්‍යාපාර සංවර්ධනය

පසුගිය අත්දැකීම්වලින් පෙනී ගොස් ඇති අන්දමට රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන ද බොහොමයක් ඔවුන්ගේ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සහාය අපේක්ෂා කරති. මෙහිදී, ප්‍රතිඵල අරමුණු කරගත් ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා මේ සියලු ක්‍රියාකාරකම් තෝරා බේරාගැනීමකට ලක් කිරීම උචිතය. මෙම ව්‍යාපාර සංවර්ධන කටයුතු අප ආයතනයෙහි අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. අදාළ ආයතන සමගින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පාලක සභාවේද අනුමැතිය ලබා ගෙන එම වැඩසටහන් සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු අධ්‍යක්ෂවරයා විසින් සම්පාදනය කරනු ලැබේ.

**4.9** ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු සහ අධ්‍යාපන ආයතන සමගින් ඇති කරගනු ලබන සබඳතා

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ජාතික මෙන්ම ජාත්‍යන්තර ආයතන සමගද බැඳී පවතී. මෙම සම්බන්ධතාවයන් දෙපාර්ශවයේම යහපත උදෙසා පවත්වාගෙන යන ඒවා වේ. විදේශගත පුහුණු ලබා ගැනීම සඳහා වන අවස්ථා වැඩි දියුණු කිරීමට එසේ ඇතිකරගන්නා ලද සබඳතාවයන් මගින් පහසුකම් සලසා තිබේ. (CLGF)

2014 වසරේදීද LOGOTRI, UNESCAP, JICA, CITYNET, USAID සහ UN-HABITAT යනාදී සංවිධාන සමගින් තොරතුරු හුවමාරු කරගැනීමට පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් අපේක්ෂා කරයි.

**4.10.** පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි කළමනාකාරිත්ව ව්‍යුහය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි කළමනාකාරිත්වය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ සියලුම තීරණ ගනු ලබන්නේ පාලක සභාව විසිනි. නිශ්චිත අමාත්‍යාංශ කිහිපයක ලේකම්වරුන්ගෙන් සහ වෘත්තියමය ආයතනවල නියෝජිතයින්ගෙන් එම පාලක සභාව සමන්විත වී තිබේ. එහි සභාපති ධූරය දරන්නේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසිනි.

පාලක සභාවේ කැඳවුම්කරු වන  පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂවරයා ආයතනයෙහි ප්‍රධාන විධායක නිලධාරියාද වේ. පාලක සභාවේ පොදු මගපෙන්වීම යටතේ ඔහු කටයුතු කරනු ලැබේ. අධ්‍යක්ෂවරයාගේ සහායට උපදේශක කණ්ඩායමක්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු, ගණකාධිකාරිවරයෙක් මෙන්ම සහාය කාර්යමණ්ඩලයක් ද සිටී.

පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය වත්මනෙහිදි ප්‍රධාන අංශ 7 ක් යටතේ සංවිධානය වී තිබේ. ඒවා නම්, මානව සම්පත් සංවර්ධන හා පොදු කළමනාකරණ අංශය, ඉංජිනේරු අංශය, භෞතික සැලසුම් අංශය, මූල්‍ය කළමනාකරණ අංශය, නෛතික හා ව්‍යවස්ථා සම්පාදක අංශය, පර්යේෂණ සහ ප්‍රකාශන අංශය, පරිපාලන සහ ගිණුම් අංශය වේ.

**4.11.** සහායක කාර්ය මණ්ඩලය වර්ධනය කර ගැනීම

සංවර්ධන වැඩසටහන් සහකාරවරුන් වශයෙන් මෑතකදී උපාධිධාරීන් පත් කිරීමත් සමගින් සියලුම පළාත් පාලන ආයතනවල මානව සම්පත් සාධකය වර්ධනය වී ඇත. මෙය යහපත් සාධකයක් වේ. කෙසේ වුවද, සේවක මණ්ඩලයෙන් වඩාත් හොඳ සේවාවක් ලබාගැනීම සඳහා කාර්යසාධනය සහ කාර්ය තත්ත්වයන් වැඩි දියුණු කිරීම පළාත් පාලනයේදී අත්‍යවශ්‍ය වන අංගයක් වේ.

එම නිසා,  කාර්යක්ෂම සහ සඵලදායී සේවා සැපයුමක් නිර්මාණය කරගැනීම පිණිස  කාර්යමණ්ඩලයේ දැනුම සහ අවබෝධය වැඩි දියුණු කිරිම සඳහා ඔවුන් දැනුවත් කිරීමට අප ආයතනය විසින් විවිධ වැඩසටහන් සැලසුම් කරන ලදී.

**5.0 2014** වර්ෂයේදී ආයතනයේ සේවක සැකසුම

2014 වර්ෂයේදී  ආයතනයේ සමස්ත සේවක සැකසුම පහත පරිදි වේ;

| අංශය | අනුමත සේවක සංඛ්‍යාව | | | තථ්‍ය සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | විධායක | විධායක නොවන | එකතුව | විධායක | විධායක නොවන | එකතුව |
| පරිපාලන අංශය | 06 | 22 | 29 | 04 | 21 | 20 |
| ඉංජිනේරු අංශය | 01 | 01 | 02 | 01 | 01 | 02 |
| කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය | 01 | 01 | 02 | 01 | 01 | 02 |
| භෞතික සැලසුම් අංශය | 01 | 01 | 02 | 01 | 01 | 02 |
| මූල්‍ය කළමනාකරණ අංශය | 01 | 01 | 02 | 01 | 01 | 02 |
| නෛතික හා ව්‍යවස්ථා සම්පාදක අංශය | 01 | 01 | 02 | 01 | 01 | 02 |
| පර්යේෂණ අංශය | - | 02 | - | 01 | 01 | 02 |
| පුහුණු අංශය | - | 01 | - | 01 | 01 | 02 |
| ගිණුම් අංශය | 02 | 03 | 05 | 01 | 02 | 03 |
| එකතුව | | | **44** | එකතුව | | **42** |

**6.0 2014** වර්ෂය තුළ කාර්ය සාධනය

| | විස්තරය | අනුමත අයවැය | මුළු වියදම | අනුමත අයවැයෙන් භාවිතා කර ඇති ප්‍රතිශතය | සම්පූර්ණ කරන ලද වැඩමුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ඉංජිනේරු අංශය | 2,400,000.00 | 2,071,149.15 | 86 | 16 |
| 02 | පොදු කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය | 2,400,000.00 | 1,928,327.00 | 80 | 49 |
| 03 | භෞතික සැලසුම් අංශය | 2,400,000.00 | 2,223,080.00 | 93 | 43 |
| 04 | මූල්‍ය කළමනාකරණ අංශය | 2,400,000.00 | 3,017,490.78 | 126 | 78 |
| 05 | නෛතික හා ව්‍යවස්ථා සම්පාදක අංශය | 2,400,000.00 | 2,754,016.77 | 115 | 77 |
| 06 | පුහුණු අංශය | 2,400,000.00 | 3,900,469.19 | 163 | 100 |
| 07 | පළාත් පාලනය පිළිබඳව වන ශ්‍රී ලංකා ආයතනයේ ශක්‍යතා වර්ධනය | 3,200,000.00 | 2,144,870.29 | 67 | -- |
| 08 | පර්යේෂණ සහ සංවර්ධන අංශය | 2,400,000.00 | 2,316,170.00 | 97 | 23 |
| එකතුව | | **20,000,000.00** | **20,355,573.18** | **102** | **386** |

**7.0.** ආයතනයෙහි එක් එක් අංශයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු

**7.1.** ඉංජිනේරු අංශය

පළාත් පාලන ආයතන වල කාර්මික අංශවල මෙන්ම පළාත් සභාවල ඉංජිනේරු අංශයන්හි කාර්යසාධනය වර්ධනය කිරීම භාරව කටයුතු කරන්නේ මෙම ඉංජිනේරු අංශය මගින් වේ. ආයතනික අභිමතාර්ථයන්ට අනුකූලව සිදු කෙරෙන පුහුණුවීම් සහ පර්යේෂණ යනාදිය හරහා මෙකී අරමුණ සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වේ. ඉංජිනේරුවන්ට, වැඩ අධිකාරීන්ට සහ කාර්මික නිලධාරීන්ට අදාළ වන පරිදි තෝරා ගත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පුහුණුවීම් ලබා දීමට මේ වසරේදී කටයුතු කරන ලදී. ඊට අමතරව, පළාත් සභාවලට අනුයුක්තව සේවය කරන ඉංජිනේරුවන්ට සහ කාර්මික නිලධාරීන්ට කුසලතා වර්ධනය සඳහා අදාළ වන්නා වූ වැඩසටහන්ද පවත්වන ලදී.

- වෙන් කරන ලද මුදලින් වැය වූ මුදල් ප්‍රමාණය (ශ්‍රී. ලං. රු. 000') - Rs. 2,071/-
- සම්පූර්ණ කරන ලද වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව - 16
- අරමුදල් භාවිතා ප්‍රතිශතය - 86%

| අයවැය කේතය | වැඩසටහන / ක්‍රියාකාරකම | අයවැයගත දින සංඛ්‍යාව | තථ්‍ය දින සංඛ්‍යාව | අයවැය ගත වියදම රු. | තථ්‍ය වියදම රු. |
|---|---|---|---|---|---|
| E01 | පළාත් ඉංජිනේරුවන් සදහා පවත්වන ලද විශේෂිත වැඩසටහන් | 02 | -- | 100,000.00 | -- |
| E02 | පළාත්පාලන ආයතනවල සේවය කරන කාර්මික නිලධාරීන් සදහා පවත්වන ලද දැනුම් වර්ධන වැඩසටහන | 04 | 04 | 300,000.00 | 267,637.50 |
| E03 | පළාත් සභා වල සේවය කරන කාර්මික නිලධාරීන්ට ලබා දුන් පුහුණු වැඩසටහන | 02 | 02 | 100,000.00 | 101,043.00 |
| E04 | පළාත් පාලන ආයතන වලට අළුතින් බඳවාගත් කාර්මික නිලධාරීන්ට ලබා දුන් පුහුණු වැඩසටහන් | 03 | 03 | 200,000.00 | 108,966.90 |
| E05 | පළාත්පාලන ආයතනවල වැඩ අධීක්ෂකවරුන්ට ලබා දුන් පුහුණු වැඩසටහන් | 04 | 03 | 240,000.00 | 157,459.50 |
| E06 | සියළු පළාත් සඳහා වූ විශේෂිත වැඩසටහන | 02 | 04 | 160,000.00 | 214,891.50 |
| E07 | පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන | 01 | 05 | 400,000.00 | 312,315.75 |
| E08 | ග්‍රාමීය මාර්ග පිලිබඳ දත්ත පදනම යාවත්කාලීන කිරීම | 05 | 05 | 160,000.00 | 88,223.00 |
| E09 | පළාත් පාලන ඉංජිනේරු ඩිප්ලෝමා පැවැත්වීම | -- | -- | 150,000.00 | Not Approved |
| E10 | පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල කාර්මික නිලධාරීන්ගේ සහ අදාළ වන අනෙක් අනෙකුත් කාර්යමණ්ඩලයේ දැනුම් වර්ධනය සහ කුසලතා සංවර්ධනය | 04 | 07 | 360,000.00 | 582,517.00 |
| E11 | තාක්ෂණ ග්‍රාන්ථ (සිංහල සහ දෙමල) යළි මුද්‍රණය | -- | -- | 230,000.00 | 238,095.00 |
| | එකතුව | **76** | **16** | **2,400,000.00** | **2,071,149.15** |

**7.2.** පොදු කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

ශ්‍රී ලංකාවේ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල තෝරා පත් කර ගත් සභිකයින් සහ කාර්යමණ්ඩලයේ කළමනාකරණ හැකියාවන් වැඩි දියුණු කිරීමේ  අරමුණ ඇතිව පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පොදු කළමනාකරණ අංශය ස්ථාපිත කර තිබේ. මෙම අංශය මගින් පළාත් සභා වල සහ පළාත් පාලන ආයතනවල වත්මන් ශක්‍යතා වර්ධන අවශ්‍යතාවයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ආයතනමය සවිබලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.  දේශපාලන නායකයින්, රජයේ නිලධාරීන් සහ සිවිල් සමාජය තුළ බලය බෙදා හැරීම සහ යහපාලනය පිළිබඳ ඇති පොදු අවබෝධය වර්ධනය කිරීම සඳහා මෙහිදී ප්‍රමුඛතාවය දෙනු ලැබේ. ජාතික මට්ටමින් පවත්වාගෙන යනු ලබන වැඩසටහන්වලට අමතරව අවශ්‍යතාවයන්ට සරිලන පරිදි විශේෂිත වැඩසටහන්ද හඳුන්වාදීමට කටයුතු කරනු ලැබේ.

දිවයින තුල මෙන්ම කළාපයේද පළාත් පාලනය සම්බන්ධයෙන් වන යහපරිචයන් මනාව සලකා බැලීමෙන් අනතුරුව, සෑම වසරේම ක්‍රියාත්මක සැලසුම සම්පාදනය කරගනු ලැබේ. විශේෂයෙන්ම වත්මන් වාතාවරණය ගත් කල පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල පවතින ශක්‍යතා මට්ටම් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

මෙම අංශයෙහි අභිමතාර්ථ :

- ❖ යහපාලනය සාක්ෂාත් කර ගැනීම සඳහා, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට තෝරා පත් කර ගෙන ඇති සභිකයින්ගේ සහ එහි නිලධාරීන්ගේ කළමනාකරණ හැකියාවන් වැඩි දියුණු කිරීම
- ❖ ප්‍රජාවට වඩාත් විශිෂ්ඨ වූ සේවාවක් සපයා දීම සඳහා, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට තෝරා පත් කර ගත් සභිකයින්ගේ සහ ඒවායේ සේවය කරන නිලධාරීන්ගේ කාර්යසාධනය වැඩි දියුණු කර, ඔවුන්ගේ ආකල්ප පරිවර්තනයකට භාජනය කිරීමේ අරමුණින් ඔවුන්ගේ ශක්‍යතා වර්ධනය
- ❖ උප ජාතික මට්ටමේදී සංවර්ධනය සඳහා වන බාධක වෙතොත් ඒවා ඉවත් කිරීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශ අතර හවුල්කාරිත්ව වර්ධනය
- ❖ මහජනතාවට වඩාත් හොඳ සේවාවක් ලබා දීමටත්, අනෙකුත් පාරිභෝගිකයින් තෘප්තිමත් කිරීමටත්, ආයතනවල කාර්යක්ෂමතාවය, සඵලදායිත්වය සහ ඵලදායිතාවය වර්ධනයට කටයුතු කිරීම

- වෙන් කරන ලද මුදල් වලින් වියදම් කළ මුදල් ප්‍රමාණය (ශ්‍රී.ලං.රු. 000’) - Rs. 1,928/-
- සම්පූර්ණ කරන ලද වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව - 49
- අරමුදල් භාවිත ප්‍රතිශතය - 80%

| අයවැය ශීර්ෂය | වැඩසටහන / ක්‍රියාකාරකම | අයවැයගත දින සංඛ්‍යාව | තථ්‍ය දින සංඛ්‍යාව | අයවැය ගත වියදම රු. | තථ්‍ය වියදම රු. |
|---|---|---|---|---|---|
| GM/1 | තෝරා පත්කරගත් සභිකයින් සඳහා පවත්වන පුහුණු වැඩසටහන | 03 | 03 | 150,000.00 | 113,508.00 |
| GM/2 | පළාත් පාලනය ආයතන සඳහා පවත්වන දැනුම් වර්ධක වැඩසටහන | 06 | 04 | 300,000.00 | 180,463.00 |
| GM/3 | පළාත් පාලනය ආයතන සඳහා පවත්වන කුසලතා වර්ධක වැඩසටහන | 06 | 04 | 300,000.00 | 208,313.00 |
| GM/4 | පළාත් පාලනය ආයතන සඳහා පවත්වන පුස්තකාල සංවර්ධන වැඩසටහන | 04 | 02 | 200,000.00 | 107,427.00 |
| GM/5 | පළාත් පාලනය ආයතනවල සුළු සේවකයින් හා අදාළ අනෙකුත් සේවකයින්ට පවත්වන පුහුණු වැඩසටහන | 02 | 03 | 100,000.00 | 71,757.00 |
| GM/6 | කාර්යාල කළමනාකරණය, ආයතනික මානව සම්පත් සංවර්ධනය සහ යහපාලනය පිළිඳ කාර්යසාධනය වර්ධනය සඳහා වන වැඩසටහන | 06 | 07 | 300,000.00 | 220,409.00 |
| GM/7 | ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 12 | 12 | 150,000.00 | 186,588.00 |
| GM/8 | පුස්තකාල කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 12 | 12 | 150,000.00 | 363,025.00 |
| GM/9 | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 12 | 00 | 150,000.00 | -- |
| GM/10 | විශේෂ පුහුණු වැඩසටහන් | 02 | 02 | 200,000.00 | 76,837.00 |
| GM/11 | පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන් | -- | -- | 400,000.00 | 400,000.00 |
| | **එකතුව** | **65** | **49** | **2,400,000.00** | **1,928,327.00** |

**7.3. භෞතික සැලසුම් අංශය**

භෞතික සැලසුම් ක්ෂේත්‍රයෙහි දැනුම, ආකල්ප, නිපුණතා සහ සේවා තත්ත්වයන් මෙන්ම පුහුණු සහ උපදේශක සේවාවන් පිලිබඳ දැනුම වර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සහ පළාත් සභා වල දේශපාලන නියෝජිතයින්ගේ සහ අදාළ වෙනත් නිලධාරින්ගේ කාර්යසාධනය වර්ධනය කිරීම පිණිස කටයුතු කිරීම මෙම අංශයේ ප්‍රධාන අභිමතාර්ත්‍ය වේ. මේ හරහා අවසාන වශයෙන් අරමුණු කරගෙන ඇත්තේ අදාළ ප්‍ර දේශය තුල ජීවත්වන්නා වූ ජනතාවගේ ජීවන මට්ටම සහ පරිසරය වඩාත් යහපත් තත්ත්වයකට ගෙන ඒම වේ.

- වෙන් කරන ලද මුදලින් වැය වූ මුදල් ප්‍රමාණය (ශ්‍රී ලං රු 000') - Rs. 2,223/-
- සම්පූර්ණ කරන ලද වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව - 43
- අරමුදල් භාවිත ප්‍රතිශතය - 93%

| අයවැය කේතය | වැඩසටහන / ක්‍රියාකාරකම | අයවැයගත දින සංඛ්‍යාව | තථ්‍ය දින සංඛ්‍යාව | අයවැය ගත වියදම රු. | තථ්‍ය වියදම රු. |
|---|---|---|---|---|---|
| PP/NL/01 | තෝරා පත්කරගත් සභිකයින් සඳහා පවත්වන පුහුණු වැඩසටහන | 04 | 06 | 200,000.00 | 190,300.00 |
| PP/NL/02 | ආපදා අවදානම අවම කිරීම පිළිබඳ පුහුණුව | 04 | 04 | 240,000.00 | 240,000.00 |
| PP/NL/03 | තක්සේරුකරණය පිළිබඳ වැඩසටහන | 02 | 02 | 120,000.00 | 102,450.00 |
| PP/NL/04 | GIS ,GPS සහ දුරස්ථ සංවේදනය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන | 10 | 10 | 600,000.00 | 610,000.00 |
| PP/NL/05 | නාගරික සැලසුම සහ නාගරික කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 04 | 02 | 240,000.00 | 78,830.00 |
| PP/NL/06 | ව්‍යාපාර කළමනාකරණ සහතිකපත් පාඨමාලාව | 12 | 12 | 400,000.00 | 400,000.00 |
| PP/NL/07 | තෝරාගත් පළාත්පාලන ආයතන සඳහා ලබාදුන් ආදර්ශ සංවර්ධන සැලසුම් සම්පාදන පුහුණුව | 02 | 07 | 200,000.00 | 201,500.00 |
| PP/PL/01 | පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන් | -- | -- | 400,000.00 | 400,000.00 |
| | එකතුව | **38** | **43** | **2,400,000.00** | **2,223,080.00** |

**7.4** මූල්‍ය කළමනාකරණ අංශය

මූල්‍ය කළමනාකරණ අංශයේ අවධානය ප්‍රධාන වශයෙන් යොමුවන්නේ පහත කරුණු කෙරෙහි වේ;

- ❖ මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පළාත් පාලන අයතනවල කාර්යමණ්ඩලය සතු දැනුම සහ අවබෝධය වර්ධනය කිරීම
- ❖ තෝරාපත් කර ගනු ලැබූ සභිකයින්ට මූල්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළු පැවැත්වීම
- ❖ මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය උපදෙශන සේවා සැපයීම
- ❖ මූල්‍ය කළමනාකරණය පිලිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම

මේ කරුණු සම්බන්ධයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සකස් කර ඇති වැඩසටහන් පළාත් පාලන ආයතනවල කාර්යසාධනය නැංවීම සඳහා මහෝපකාරී වී තිබේ. මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන පුහුණු සඳහා වන ඉල්ලුම තවමත් පවතී. ඒ අනුව අවශ්‍යතාවයන් මත පදනම් කරගෙන සකස් කරන ලද පුහුණුවීම් පැවැත්වීමට ආයතතනය විසින් කටයුතු කර ඇති අතර ඊට අදාළ විෂයපථයන් පහත දැක්වේ.

- ✧ මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම
- ✧ අයවැය සැකසීම, අයවැය පාලනය සහ අධීක්ෂණය
- ✧ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් පිලිබඳ දැනුවත්කිරීම සහ ඒවා යොදාගැනීම
- ✧ මුදල් ප්‍රවාහ ප්‍රකාශ සහ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීම
- ✧ ශ්‍රී ලංකාවේ විගණනය සහ විගණන ප්‍රමිතින් පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම
- ✧ අභ්‍යන්තර පාලන විධි පිළිබඳ දැනුවත්වීම
- ✧ පළාත් පාලන මූල්‍ය කමනාකරණය පිලිබඳ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම
- ✧ පසුගාමී පළාත් පාලන ආයතන සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම පිලිබඳ සේවාස්ථ පුහුණු ලබාදීම

- වෙන් කරන ලද මුදලින් වැය වූ ප්‍රමාණය (ශ්‍රී. ලං. රු. 000') - Rs. 3,017/-
- සම්පූර්ණ කරන ලද වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව - 78
- අරමුදල් භාවිත ප්‍රතිශතය - 126%

| අයවැය කේතය | වැඩසටහන / ක්‍රියාකාරකම | අයවැයගත දින සංඛ්‍යාව | තථ්‍ය දින සංඛ්‍යාව | අයවැය ගත වියදම රු. | තථ්‍ය වියදම රු. |
|---|---|---|---|---|---|
| FM-01 | පළාත් පාලන ආයතනවල මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව | 24 | 23 | 960,000.00 | 741,576.60 |
| FM-02 | පළාත් පාලන ගිණුම්කරන පද්ධතිය, රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ඉදිරිපත් වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 18 | 24 | 900,000.00 | 1,043,464.68 |
| FM-03 | 2014 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ පසුගාමී පළාත් පාලන ආයතන සඳහා ලබා දුන් සේවාස්ථ පුහුණු වැඩසටහන් | 04 | 10 | 140,000.00 | 79,358.75 |
| FM-04 | පළාත් පාලන ආයතන සඳහා වාර්ෂික අයවැය සකස් කිරීම | 10 | 21 | 400,000.00 | 1,153,090.75 |
| | එකතුව | **56** | **78** | **2,400,000.00** | **3,017,490.78** |

**7.5** නෛතික සහ ව්‍යවස්ථා සම්පාදක කටයුතු අංශය

ශ්‍රී ලංකාවේ උප ජාතික මට්ටමේ පාලන තලය තුළ තෝරා පත් කරගත් සභිකයින් සහ නිලධාරීන්ගේ ව්‍යවස්ථා සම්පාදක හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ නෛතික සහ ව්‍යවස්ථා සම්පාදක කටයුතු අංශය බලවරම් ලබා තිබේ. රටේ උප ජාතික තලය සමන්විත වන්නේ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලින් වන අතර ඒවාට අදාළ පාලන නීති විධිවිධාන හරහා එම ආයතන නෛතික බලවරම් ලබා ඇත. එමනිසා එකී ආයතනවල සංයුතිය, සංස්ථාපනය, බලතල සහ කාර්යභාරයන් ව්‍යවස්ථාදායක පදනමක් මත ගොඩනැගී තිබේ. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට තෝරා පත් කර ගෙන ඇති සභිකයින්ට සහ ඒවායේ සේවය කරන නිළධාරීන්ට අනු නීති සහ නීති කෙටුම්පත් කිරීම, සමාලෝචනය කිරීම, වලංගු කිරීම සහ අනුමත කිරීම සඳහා වන ව්‍යවස්ථාදායක හැකියාවන් මෙන්ම පවතින නීති දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම් සඳහා අදාළ කර ගැනීම සම්බන්ධයෙන් වන හැකියාව ද දූර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය කර තිබේ. පුළුල් පරාසයක වන නෛතික ගැටළු, අක්‍රමිකතා, අවබාධිත සහ නීති උල්ලංඝන වලට මුහුණ දීම සඳහා පළාත් සභා පළාත් පාලන ආයතන වලට මග පාදන්නා වූ බරපතල අඩුපාඩුවක් වශයෙන් මෙය හඳුනාගෙන තිබේ.

පළාත් පාලන ආයතන සහ පළාත් සභා වල පවතින තත්ත්වය, පුහුණු අවශ්‍යතා සහ වුවමනාවන් හඳුනාගැනීමෙන් සහ ඇගයුම් කිරීමෙන් අනතුරුව ඒවා සඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීමේ අරමුණ ඇතිව නෛතික සහ ව්‍යවස්ථාදායක කටයුතු අංශයේ වැඩසටහන් විශේෂයෙන්ම නිර්මාණය කර තිබේ. තවද, රටේ සාමාන්‍ය නීතිය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනවල පවතින දැනුම් අඩුපාඩුව සපුරාලීම අරමුණු කරගෙන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අනු නීති, පරිපාලන නීතිය, අධිකරණ කාර්යපාටිපාටිය, සහ පළාත් පාලන ආයතනවල සභා කටයුතු යනාදිය පිලිබඳ විශේෂ අවධානයක් යොමු කරන්නා වූ 'පළාත් පාලන නීතිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව' නම් වූ නව පාඨමාලාවක් හඳුන්වා දීමට කටයුතු කර තිබේ.

පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ව්‍යවස්ථාදායක හැකියාවන් ශක්තිමත් කිරීමේ පොදු අභිමතාර්ථය කෙරෙහි අවධානය යොමු කරමින් පහත දැක්වෙන්නා වූ විශේෂිත අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සම්බන්ධයෙන් මෙම අංශය කටයුතු කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| * | වෙන් කරන ලද මුදලින් වැය කළ මුදල් ප්‍රමාණය (ශ්‍රී. ලං. රු. 000') | = | Rs. 2,754/- |
| * | සම්පූර්ණ කරන ලද වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව | = | 77 |
| * | අරමුදල් භාවිත ප්‍රතිශතය | = | 115% |

| අයවැය කේතය | වැඩසටහන / ක්‍රියාකාරකම | අයවැයගත දින සංඛ්‍යාව | තථ්‍ය දින සංඛ්‍යාව | අයවැය ගත වියදම රු. | තථ්‍ය වියදම රු. |
|---|---|---|---|---|---|
| LD/01 | පළාත් පාලන නීතිය පිළිබඳ සහතිකපත් පාඨමාලාව (ගෙවන) | **28** | 29 | 100,000.00 | 767,846.00 |
| LD/02 | අධිකරණ කාර්යපටිපාටිය සහ පළාත් පාලන ආයතනවල ගැසට් නිවේදන හා අනෙකුත් නිවේදන නිවැරදිව පලකිරීම | **04** | 04 | 200,000.00 | 106,635.00 |
| LD/03 | පළාත් පාලන ආයතනවල සභා රැස්වීම් හා කමිටු රැස්වීම් | **06** | 11 | 300,000.00 | 444,103.95 |
| LD/04 | අනු නීති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම | **06** | 04 | 300,000.00 | 94,930.00 |
| LD/05 | පළාත් සභාවල නීති කෙටුම්පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම | **04** | 01 | 200,000.00 | 129,659.36 |
| LD/06 | පළාත් පාලන නීතිය හඳුන්වාදීම | **06** | 07 | 300,000.00 | 278,209.86 |
| LD/07 | පළාත් පාලන නීතියේ විකාශය (1861-2012) | **06** | 11 | 300,000.00 | 524,217.05 |
| LD/08 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඇති වගන්ති සහ රිට් ආඥා අයදුම්පත් | **06** | 10 | 300,000.00 | 408,415.55 |
| LD/09 | පළාත් පාලන ආයතන හා පළාත් සභාවල නෛතික ගැටළු සම්බන්ධයෙන් උපදේශක සේවා ලබාදීම | **--** | -- | -- | -- |
| LD/10 | පළාත් පුහුණු | **--** | -- | 400,000.00 | -- |

| | | | | |
|---|---|---|---|---|
| එකතුව | **66** | **77** | **2,400,000.00** | **2,754,016.77** |

**7.6** පුහුණු අංශය

ආයතනයේ පුහුණු අංශය විසින් නිලධාරීන්ගේ සහ පළාත් සභා හා පළාත් පාලන අයතන වෙත තෝරා පත්කරගත් සභිකයින්ගේ මානව සම්පත් සංවර්ධනය සඳහා අහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදුකර ඇත.

- පුහුණු අවශ්‍යතා ඇගැයුම
- ඉලක්ක කණ්ඩායම් හඳුනාගැනීම
- පුහුණු අත්පොත් හා මොඩියුල සම්පාදනය
- පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- පළාත්සභා සහ පළාත් පාලන ආයතනවල සභිකයින් හා නිලධාරීන් සඳහා වැදගත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පුහුණු සංවිධානය කිරීම
- පළාත් පාලනය පිළිබඳ ජාතික මට්ටමේ ඩිප්ලෝමා/ සහතිකපත්‍ර පාඨමාලා පැවැත්වීම
- පළාත් පාලනය පිළිබඳ තොරතුරු බෙදාහැරීම
    - තෛමාසික පුවත් ලිපිය (දෙමල/ සිංහල)
    - පළාත් පාලන ජර්නලය (වාර්ෂික)
- පළාත් පාලනය පිළිබඳ යාවත්කාලීන කළ පුස්තකාලයක් ඇතිකර පවත්වාගෙන යාම
- පළාත් සභා සහ පළාත් පාලන පුහුණු පැවැත්වීම සඳහා කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සහ පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ ශක්තිය වර්ධනය සහ ඔවුනට සහය ලබාදීම
- කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සහ පළාත් පාලන කොමසාරිස්වරුන් පළාත් මට්ටමින් පවත්වන පුහුණු සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගැයුම

වෙන් කරන ලද මුදල් ප්‍රමාණය (ශ්‍රී ලං රු 000’) = Rs. 3,900

සම්පූර්ණ කරන ලද වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව = 100

අරමුදල් භාවිත ප්‍රතිශතය = 163 %

| අයවැය කේතය | වැඩසටහන / ක්‍රියාකාරකම | අයවැයගත දින සංඛ්‍යාව | තථ්‍ය දින සංඛ්‍යාව | අයවැය ගත වියදම රු. |
|---|---|---|---|---|
| T/01 | පළාත් පුහුණුකරුවන් සඳහා වූ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 300,000.00 | 04 | 331,069.00 |
| T/02 | පළාත් සභා සහ පළාත්පාලන ආයතන පරිපාලනයේ යෙදී සිටින කාන්තාවන් ශක්තිමත් කරවීම | 300,000.00 | 03 | 245,534.08 |
| T/03 | ප්‍රජා සංවර්ධනය පුහුණු වැඩසටහන | 300,000.00 | 05 | 214,695.00 |
| T/04 | පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන් | 400,000.00 | 12 | 233,000.00 |
| T/05 | කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනවල හමුව | 300,000.00 | 03 | 207,691.35 |
| T/06 | පුහුණු අත්පොත් හා පුහුණු මාර්ගෝපදේශ | 200,000.00 | -- | 255,980.00 |
| T/07 | පුස්තකාලය සංවර්ධනය | 200,000.00 | -- | 269,084.26 |
| T/08 | පුවත් ලිපිය | 200,000.00 | -- | 81,731.50 |
| T/09 | 'පලාත් පාලනය" ජර්නලය | 200,000.00 | 01 | 100,000.00 |
| T/10 | *පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 40,000/- per participant | 31 | 884,364.50 |
| T/11 | * පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 40,000/- per participant | 16 | 561,867.00 |
| | * පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමාව | | 25 | 515,452.50 |
| | එකතුව | **2,400,000.00** | **100** | **3,900,469.19** |

*බාහිර පාඨමාලා ගාස්තුවෙන් කොටසක්

**7.7.** පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ ශක්‍යතා වර්ධනය

පසුගිය වසර 6 ක කාලයක් මුළුල්ලේ විවිධ සන්ධිස්ථාන පසුකරමින් පැමිණි පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මේ දක්වා තමන් සාක්ෂාත් කරගෙන ඇති කාර්යසාධනය දෙස නැවත හැරී බලා, එහි විශේෂිත වැඩසටහන් සම්බන්ධයෙන් සිදුකෙරෙන කාර්යභාරයට මග පෙන්වීම සඳහා එම අභ්‍යාසයේ ප්‍රතිඵල භාවිතා කිරීම වැදගත් වේ. එමෙන්ම, එහි ඉලක්ක සහ අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමේදී ආයතනය මගින් ඇති කර තිබෙන බලපෑම කෙබඳු වේදැයි ඇගයුම් කිරීමේ අවශ්‍යතාවයක්ද පවතී. හුදෙකලාවීමකින් තොරව ආයතනයේ කාර්යභාරයන් ඉටු කිරීමට අපේක්ෂා කරන ලදී.

- වෙන් කරන ලද මුදලින් වැය වූ මුදල් ප්‍රමාණය (ශ්‍රී ලං රු 000') - Rs. 2144
- සම්පූර්ණ කරන ලද වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව - --
- අරමුදල් භාවිත ප්‍රතිශතය - 67%

| අයවැය කේතය | වැඩසටහන / ක්‍රියාකාරකම | අයවැයගත වියදම | තථ්‍ය වියදම |
|---|---|---|---|
| DD/01 | ආයතනයේ කාර්යමණ්ඩලයේ ශක්‍යතා වර්ධනය (දේශීය හා විදේශීය) | 300,000.00 | 80,900.00 |
| DD/02 | ජාත්‍යන්තර සංවිධාන සමග ජාලකරණය, සාමාජික ගාස්තු සහ පළාත් පාලනය පිළිබඳව විදේශ ආයතන සමගින් අත්දැකීම් බෙදාහදාගතහැකි තවත් අවස්ථා පිළිබඳව සොයාබැලීම | 150,000.00 | 156,983.60 |
| DD/03 | 2012 හා 2013 වාර්ෂික වාර්තා, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව, වාර්ෂික ක්‍රියාත්මක සැලසුම සහ 2015 වර්ෂය සඳහා වන අයවැය සකස් කිරීම | -- | 1,548.00 |
| DD/04 | පළාත් පාලනයට පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ප්‍රතිව්‍යහගත කිරීම සම්පූර්ණ කර විධිමත් අනුමැතිය ලබාගැනීම | -- | -- |
| DD/05 | පළාත් පාලනයට පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට බදු රහිත වාහනයක් මිලදී ගැනීම | -- | -- |
| DD/06 | ප්‍රදර්ශන, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ වැඩසටහන් සහ සම්මන්ත්‍රණ පැවැත්වීම | 400,000.00 | 278,056.50 |
| DD/07 | ජාතික ඩිප්ලෝමා සහ සහතිකපත් පාඨමාලා සඳහා ලබා දුන් සහන | 550,000.00 | 532,696.00 |
| DD/08 | ජාතික ඩිප්ලෝමා සහ සහතික පත් ප්‍රදාන උළෙල | 350,000.00 | 102,500.00 |
| DD/09 | **තොරතුරු තාක්ෂණ සහ පුහුණු වැඩසටහන් | 750,000.00 | 709,648.69 |
| DD/10 | පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම | 500,000.00 | 43,537.50 |
| DD/11 | දේශීය හා විදේශීය අරමුදල් ලැබෙන ව්‍යාපෘති සොයාගැනීමට වැයම් කිරීම | -- | -- |
| DD/12 | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්යමණ්ඩලයේ දිරිදීමනා සැලසුම සකස් කිරීම | -- | -- |
| DD/13 | අමාත්‍යාංශයෙන් ලැබෙන විශේෂ පැවරුම් | 100,000.00 | 239,000.00 |
| | එකතුව | **3,200,000.00** | **2,144,870.29** |

** තොරතුරු තාක්ෂණ පාඨමාලාව ස්වයං අරමුදල් භාවිතා කරන්නකි

**7.8.** පර්යේෂණ සහ සංවර්ධන අංශය

පළාත් පාලන සහ පළාත් සභා ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට අවශ්‍ය කරන තොරතුරු සහ ප්‍රතිඵල ඒ සම්බන්ධයෙන් සිදු කෙරෙන පර්යේෂණ සහ සමීක්ෂණ හරහා බෙදා හැරීම තුලින් පළාත් පාලන ආයතන සහ පළාත් සභාවන්ට අවශ්‍ය සහාය ලබාදීම කෙරෙහි පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පර්යේෂණ අංශය විසින් මූලිකවම සැලකිලිමත් වේ. ඊට අමතරව තම පර්යේෂණ හරහා සොයා ගත් කරුණු මත පදනම් වෙමින් පුහුණු වැඩසටහන් හා සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරතවීමටද මෙම අංශය කටයුතු කරයි.

අභිමතාර්ථ :

- පළාත් පාලන ආයතන සහ පළාත්සභා වැඩිදියුණු කර ඒවායේ ශක්‍යතාව වර්ධනය සඳහා එම ආයතන පිළිබඳ පර්යේෂණ අධ්‍යයන සිදුකිරීම සහ ප්‍රවර්ධනය

- පර්යේෂණ හරහා සොයාගත් කරුණු අදාළ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ක්‍රියාත්මක කිරීමේ ආයතන අතර බෙදා හැරීම

- පාලනය සම්බන්ධයෙන් වන ජාතික මට්ටමේ මෙන්ම ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ ආයතන සමග සම්බන්ධ වීම.

- නව පර්යේෂණ මුල්පිරිම් සඳහා වැදගත් වන අංශ හඳුනා ගැනීම .

- පළාත් සභා සහ පළාත් පාලන ආයතන සම්බන්ධ දත්ත පදනමක් පවත්වාගැනීම.

- පර්යේෂණ නිමැවුම් ලේඛනගත කිරීම.

- පළාත්පාලනය සහ පළාත් සභා විෂයයට අදාළ ප්‍රකාශන නිකුත් කිරීම.

- ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් පළාත් පාලන ආයන සහ පළාත් සභාවල අදාළ නිලධාරීන්ට පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ පාඨමාලා පැවැත්වීම

- ❖ පර්යේෂණ හරහා සොයාගත් කරුණු මත පදනම් වෙමින්, පළාත්පාලන ආයතන සහ පළාත් සභාවල තෝරා පත් කරගත් සභිකයන් සහ ඒවායේ සේවයකරන නිලධාරීන්ට සංවර්ධනය සම්බන්ධ ගැටලු පිළිබඳව අවශ්‍ය කරන පුහුණු ලබා දීම
- වෙන් කරන ලද මුදලින් වැය වූ මුදල් ප්‍රමාණය (ශ්‍රී ලං රු 000') - Rs. 2,316
- සම්පූර්ණ කරන ලද වැඩසටහන් / වැඩමුළු සංඛ්‍යාව - 23
- අරමුදල් භාවිත ප්‍රතිශතය - 97%

| අයවැය කේතය | වැඩසටහන / ක්‍රියාකාරකම | අයවැයගත දින සංඛ්‍යාව | තථ්‍ය දින සංඛ්‍යාව | අයවැය ගත වියදම රු. | තථ්‍ය වියදම රු. |
|---|---|---|---|---|---|
| RD/01 | පළාත් පාලන ආයතන විසින් සපයනු ලබන මහජන උපයෝගීතා සේවාවන්හි සඵලදායීත්වය පිළිබඳ අධ්‍යනය/ පළාත් පාලන බලප්‍රදේශ තුළ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කළ පර්යේෂණ අධ්‍යනය | 01 | 01 | 400,000.00 | 400,000.00 |
| RD/02 | පළාත් පාලන ආයතන විසින් සිදුකරන ව්‍යාපාර ප්‍රවර්ධනය පිළිබඳ අධ්‍යනය: පළාත් පාලන ආයතන කෙතරම් සඵලදායී අන්දමින් ඒවා ක්‍රියාත්මක කරන්නේද, ඒවායේ බලපෑම කෙබඳු වේද? | 01 | 01 | 275,000.00 | 275,000.00 |
| RD/03 | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සියළුම අංශවල පුහුණු අවශ්‍යතා ඇගැයුම | 01 | 01 | 150,000.00 | 96,300.00 |
| RD/04 | පසුගාමී පළාත් පාලන ආයතනවල ආදායම් වර්ධන ක්‍රියාවලිය අධීක්ෂණය | As per the sample | 11 | 250,000.00 | 254,767.00 |
| Rd/P/01 | පළාත් පාලන ආයතනවල ආදායම් වර්ධනය කරගැනීම සඳහා පළාත්පාලන ආයතන මට්ටමින් සිදුකළ වැඩසටහන | 09 | 09 | 750,000.00 | 862,893.00 |
| Rd/P/04 | පළාත් පාලන ආයතන සඳහා දත්ත පදනමක් සකස් කිරීම / මීළඟ පළාත් පාලන මැතිවරණයෙන් පසු දත්ත පදනම යාවත්කාලීන කිරීම | | | 150,000.00 | 7,800.00 |
| RD/EF | සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය භාවිතා කරමින්, ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටම් වලින් පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල අදාළ නිලධාරීන් සඳහා පර්යේෂණ ක්‍රම පිළිබඳ පවත්වන ලද සහතික පත්‍ර පාඨමාලාව | 04 | 00 | 25,000.00 | 19,410.00 |
| **PCLA | පළාත් සභා මට්ටමේ සහ පළාත් පාලන මට්ටමේ ආයතන සඳහා වෙන් කිරීම | | | 400,000.00 | 400,000.00 |
| | එකතුව | **16** | **23** | **2,400,000.00** | **2,316,170.00** |

<u>සටහන්</u>

1 ශේෂය වූ රු. 142,000/-ක මුදල පාලක මණ්ඩලයේ අනුමැතිය ඇතිව, පර්යේෂණ අධ්‍යයන දෙකක් සිදුකිරීම සඳහා දත්ත පදනම් වැඩසටහනට වෙන්කරන ලදී. (ශ්‍රී ලංකාවේ පෙරපාසල් පිළිබඳ අධ්‍යයනය සහ පළාත්පාලන ආයතන විසින් පරිසර සංරක්ෂණය සමාලෝචනය පිළිබඳ අධ්‍යනය)

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

**2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන**
**මූල්‍ය ප්‍රකාශ**

**අංක 17, මලලසේකර මාවත, කොළඹ 07**
**දුරකථන : 0112570307 ෆැක්ස් : 0112570316**
**ඊමේල්: info@slilg.gov.lk**
**වෙබ් අඩවිය: www.slilg.lk**

**පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය**
**2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| | සටහන් | 31/12/2014 | 31/12/2013 |
|---|---|---|---|
| මෙහෙයුම් ආදායම | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | 01 | 48,167,000.00 | 42,078,600.00 |
| වෙනත් ආදායම් | 02 | 13,151,735.05 | 9,433,325.00 |
| මුළු මෙහෙයුම් ආදායම | | 61,318,735.05 | 51,511,925.25 |
| | | | |
| මෙහෙයුම් වියදම් | | | |
| පරිපාලන සහ ආයතනික වියදම් | 03 | 30,772,839.84 | 27,114,697.69 |
| මානව සම්පත් සංවර්ධන වියදම් | 04 | 21,466,810.22 | 19,069,655.44 |
| උපදේශක සේවා වියදම් | 05 | 2,116,853.79 | 5,097,457.86 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සහ ක්ෂයවීම් | 06 | 9,464,934.81 | 8,805,137.47 |
| මුළු මෙහෙයුම් වියදම් | | 63,821,438.66 | 60,086,948.46 |
| වර්ෂය සඳහා වන අතිරික්තය / හිඟය | | (2,502,703.61) | (8,575,023.21) |

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

**2014 දෙසැම්බර් 31 දින වන විට**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| වත්කම් | සටහන් | 2014.12.31 | 2013.12.31 |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 07 | 25,152,769.43 | 30,932,277.96 |
| | | **25,152,769.43** | **30,932,277.96** |
| කාරක ප්‍රාග්ධනය | | | |
| නව ගොඩනැගිල්ල ඉදි කිරීම | 08 | 44,757,072.25 | 3,762,415.04 |
| ජංගම වත්කම් | | | |
| තොග | 09 | 2,035,695.39 | 1,854,681.39 |
| පෙරගෙවුම් සහ ලැබිය යුතු | 10 | 1,881,469.90 | 680,733.60 |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ සහ අත්තිකාරම් | 11 | 13,889,550.97 | 13,744,422.05 |
| මුදල් හා මුදල් සමාන දෑ | 12 | 3,995,904.13 | 572,018.69 |
| | | **21,802,620.39** | **16,851,855.73** |
| මුළු වත්කම් | | **91,712,462.07** | **51,546,548.73** |
| | | | |
| සම කොටස් සහ වගකීම් | | | |
| රජයේ දායකත්වය - ප්‍රාග්ධන | | 85,885,195.41 | 45,885,495.41 |
| සමුච්චිත අරමුදල් | | (5,965,003.59) | (3,462,299.98) |
| UNDP වෙතින් ලැබූ ප්‍රදානය | | 714,658.79 | 714,658.79 |
| ව්‍යාපෘති දායකත්වය - ප්‍රාග්ධනය | | 1,595,824.75 | 1,595,824.75 |
| ආසියා පදනමෙන් ලැබූ ප්‍රදානය | | 291,000.00 | 291,000.00 |
| | | **82,521,675.36** | **45,024,378.97** |
| ජංගම නොවන වගකීම් | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 13 | 5,239,264.50 | 3,690,570.50 |
| රඳවාගත් මුදල් | | 1,512,000.00 | .- |
| | | **6,751,264.50** | **3,690,570.50** |
| ජංගම වගකීම් | | | |
| ප්‍රතිපාදන - විගණන ගාස්තු | | 500,000.00 | 500,000.00 |
| ණයකරුවෝ සහ උපචිත ගාස්තු | 14 | 1,939,522.21 | 2.331.599.26 |
| | | 2,439,522.21 | 2.831.599.26 |
| | | **91,712,462.07** | **51.546.548.73** |

*පිටු අංක 05 සිට 14 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ 2014 දෙසැම්බර් 31 වන දින වනවිට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ තත්වය පිළිබඳ සහ 2014 දෙසැම්බර් මස 31 වන දින වනවිට එහි අතිරික්තය / (හිඟය) පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබදෙයි.*

.......................................

**කස්තූරි අනුරාධනායක**
*අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී*
පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

..........................................

**කේ.ආර්.කේ. අමරසේන**
*සහකාර අධ්‍යක්ෂ (මුදල්)*
පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

## 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන
## ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | **31/12/2014** | **31/12/2013** |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ | | | |
| *සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ඇතිව තිබෙන අතිරික්තය / හිඟය* | | (2,502,703.61) | ( 8,575,023.21) |
| *මුදල් නොවෙන සංචලන සඳහා ගැලපුම්* | | | |
| *ක්ෂයවීම* | | 7,916,240.81 | |
| *පොළී වියදම්* | | 7,916,240.81 | - |
| *ප්‍රතිපාදන - විගණන ගාස්තු* | | | 100,000.00 |
| *කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය* | | **5,413,537.20** | **(305,852.74)** |
| *කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්* | | | |
| වැඩි වූ තොග (181,014.00) | | | |
| වැඩි වූ පෙර ගෙවුම්/ලැබිය යුතු | (1,200,736.30) | | 330,826.35 |
| වැඩි වූ විවිධ ණයකරුවෝ | (145,128.92) | | |
| වැඩි වූ විශ්‍රාම ප්‍රතිලාභ 1,548,694.00 | | | |
| වැඩිවූ ණයහිමියෝ | 1,119,922.95 | 1,141,737.73 | (1,363,064.48) |
| *මෙහෙයුම් තුලින් උත්පාදිත මුදල්* | | **6,555,274.93** | **(802,123.87)** |
| *ගෙවන ලද පාරිතෝෂික* | | | |
| *අතිවිශේෂ අයිතමයන්ට පෙර මුදල් ප්‍රවාහය* | | | - |
| *මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ* | | **6,555,274.93** | **(802,123.87)** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | | | |
| ස්ථාවර වත්කම් මිලට ගැනීම | **(43,140,714.67)** | | (3,912,175.04) |
| උපකරණ අළෙවිය/ බැහැර කිරීම හරහා ලද මුදල් | **9,325.18** | | |
| *ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ* | | **(43,131,389.49)** | **(4,714,298.91)** |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ | | | |
| *ප්‍රාග්ධන ප්‍රදාන* 40,000,000.00 | | | 40,000,000.00 |
| *ගෙවන ලද පොළී/ පාරිතෝෂික* | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදාගත් ශුද්ධ මුදල් | | **40,000,000.00** | **40,000,000.00** |
| *මුදල් හා මුදල් සමාන දෑ වල සිදුව ඇති ශුද්ධ වැඩිවීම* | | **3,423,885.44** | (714,298.91) |
| *කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ* 572,018.69 | | | 1,286,317.60 |
| *කාලපරිච්ඡේදය අවසන් වන විට මුදල් හා මුදල් සමාන දෑ (1 සටහන බලන්න)* | | **3,995,904.13** | **572,018.69** |

| | | |
|---|---|---|
| _**1 සටහන**_ | | |
| බැංකුවේ ඇති මුදල් | | |
| බැංකුවේ ඇති මුදල් - ලංකා බැංකු ගිණුම් අංක 2323344 | 943,151.31 | 343.573.34 |
| බැංකුවේ ඇති මුදල් - ලංකා බැංකු ගිණුම් අංක 2323350 | 1,406,058.83 | 223.862.98 |
| ඉතුරුම් ගිණුම් - ලංකා බැංකු ගිණුම් අංක 2329975 | 1,646,693.99 | 4,582.37 |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | | - . |
| | **3,995,904.13** | **572,018.69** |

පළාත් පාලන ආයතන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂයේදී
ශුද්ධ වත්කම් වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | රජයේ දායකත්වය - ප්‍රාග්ධනය | සමුච්චිත අරමුදල් | UNDP ප්‍රදාන | ව්‍යාපෘති දායකත්වය - ප්‍රාග්ධන | ආසියා පදනමෙන් ලද ප්‍රදාන | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2014.01.01 වන දිනට ශේෂය | 45,885,195.41 | 3,462,299.98 | 714,658.79 | 1,595,824.75 | 291,000.00 | 49,024,378.97 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/හිඟය | - | (2,502,703.61) | - | - | - | (2,502,703.61) |
| කාලපරිච්ඡේදය තුළ සිදු කල පැවරුම් | 40,000,000.00 | - | - | - | - | 40,000,000.00 |
| පෙර වසර සඳහා ගැලපුම් | - | - | - | - | - | - |
| 2014.12.31 වන දිනට ශේෂය | 85,885,195.41 | (5,965,003.59) | 714,658.79 | 1,595,824.75 | 291,000.00 | 82,521,675.36 |

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1.** **පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1.1** ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූල වන පරිද්දෙන් ඓතිහාසික පිරිවැය පදනම මත ආයතනයේ මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

**1.2** ශේෂ පත්‍රය සකස් කිරීමේදී පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුගමනය කර ඇති අතර එකිනෙකට අනුකූලවන පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කරගෙන තිබේ. වියදම් සහ ආදායම් උපචිත කර ඊට අදාළවන කාලසීමාව තුළ මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබේ.

**1.3** ස්ථාවර වත්කම් පිරිවැයෙන් ක්ෂයවීම් අඩුකර ශේෂපත්‍රයේ පෙන්නුම් කර තිබේ. කරගෙන යමින් පවතින ප්‍රාග්ධන වැඩ ස්ථාවර වත්කම් ලෙසින් සලකා තිබේ. රු. 324,990,00ක වටිනාකමකින් යුත් බජාජ් වර්ගයේ ත්‍රිරෝද රථය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදීමෙන් අනතුරුව ආධාරයක් වශයෙන් පුත්තලම් ප්‍රාදේශීය සභාවට ලබාදී තිබේ.

**1.4** මූලික මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති ගිණුම් වලට බලපාන්නා වූ උද්ධමන සාධක සම්බන්ධයෙන් ගැලපුම් සිදු කර නොමැත.

**1.5** ඇතැම් වත්කම් කිසිදු පිරිවැයක් නොදරා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් පරවන ලද ඒවා වේ. පවතින තොරතුරු අනුව එම එකී වත්කම් 1995 ට පෙර මිලදීගත් ඒවා වේ. එම නිසා ඒවා පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය කරන ලද වත්කම් වශයෙන් සලකනු ලැබූ අතර, එකක් රුපියල් 100 ක අවශේෂ අගයක් සහිත වත්කම් වශයෙන් එම වත්කම් වාර්තා වල පෙන්නුම් කිරීමට තීරණය කරන ලදී.

**1.6** පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් පවරන ලද අයිතම අතර වූ ඇතැම් අයිතම මිල නොසලකා හැරිය හැකි ඒවා විය. එවන් අයිතම තක්සේරු කිරීමෙන් තොරව ප්‍රමාණ පදනම මත පවත්වාගෙන යාමට තීරණය කරන ලදී

**1.7** තොග තක්සේරුව සිදුකර ඇත්තේ මුලින් ලැබූ අයිතම මුලින් මුදාහරින (FIFO) පදනම යටතේ වේ.

**1.8** වත්කම් අත්කරගත් හෝ ලබාගත් වර්ෂවලට අදාළව ක්ෂයවීම් අයකරගෙන නොමැත.

**1.9** සෑම වත්කමක් සඳහාම සරල රේඛීය ක්‍රමයට ක්ෂයවීම් අය කර තිබේ.

පළාත් පාලන ආයතන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂයසඳහා වන

ගිණුම් සඳහා සටහන්

| 1 සටහන - රජයේ දායකත්වය, පුනරාවර්තන | | | | 31.12.2014 | 31/12/2013 |
|---|---|---|---|---|---|
| 2100 - 02 | මහා භාණ්ඩාගාරය | | | 48,167,000.00 | 42,078,600.00 |
| | එකතුව | | | **48,167,000.00** | **42,078,600.00** |
| **02 සටහන- වෙනත් ආදායම්** | | | | | |
| 1505 - 01 | විවිධ ආදායම් | | | 120,427.14 | 35,750.00 |
| 1505 - 02 | කාර්ය මණ්ඩලයට ලබා දුන් ණය සඳහා පොලි | | | 508,854.84 | 520,255.03 |
| 1505 - 03 | ප්‍රකාශන අලෙවිය | | | 71,378.00 | 43,904.00 |
| 1505 - 05 | ස්ථිර තැන්පතු සහ ඉතුරුම් පොලී | | | 28,146.69 | 6,912.02 |
| 1505 – 07 | බදු කුලී ආදායම | | | | 8,000.00 |
| 2101 - 01 | පරිගණක යෙදවුම් පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලා | | | | 520,000.00 |
| 2101 - 04 | අත්තිකාරම් ගිනුම - සාමාන්‍යය | | | | 1,409,590.00 |
| 2010 - 7 | සමාජ ඒකාබද්ධතාවය සහ පරිවර්තනය සඳහා වන මූල් පිරිම් වලට පහසුකම් සැලසීම | | | | 1,138,085.50 |
| 2101 - 10 | පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | | | 7,285,000.00 | 2,588,000.00 |
| 2101 - 15 | යූ එන් හැබිටැට් ව්‍යාපෘතිය | | | 3,532,509.15 | 2,932.828.70 |
| 2101 - 16 | ග්‍රාමීය මාර්ග ව්‍යාප්ත කිරිමේ නියමු ව්‍යාපෘතිය - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | | | 1,603,950.90 | 2,932,828.70 |
| 2101-16 | පළාත් පාලන ආයතන යටිතලපහසුකම් වැඩිදියුණු කිරීමේ 2වන ව්‍යාපෘතිය | | | | 60,000.00 |
| 2101-17 | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය- වැඩසටහන් අත්තිකාරම | | | | 170,000.00 |
| 2101 - 17 | වෙනත් | | | 1,468.33 | |
| | එකතුව | | | **13,151,735.05** | **9,433,325.25** |

**පළාත් පාලන ආයතන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය**

**2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂයසඳහා වන**

**ගිණුම් සඳහා සටහන්**

| ***03 සටහන - පරිපාලන සහ ආයතනික වියදම්*** | | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|---|
| | *පුද්ගල පඩිනඩි* | | |
| 1503 - 01 - 01 | *වැටුප් හා වේතන* | 15,798,746.31 | 13,369,215.47 |
| 1503 - 01 - 02 | *සේවක අර්ථසාධක අරමුදල* | 1,741,362.00 | 1,450,212.87 |
| 1503 - 01 - 03 | *සේවක භාරකාර අරමුදල* | 435,340.76 | 361,561.71 |
| 1503 - 01 - 04 | *නිවාඩු දින වැටුප් හා අතිකාල* | 716,818.91 | 686,584.95 |
| 1503 - 01 - 05 | *අනෙකුත් දීමනා* | 438,158.21 | 337,566.00 |
| 1503 - 02 - 01 | *ගමන් වියදම් - දේශීය* | 294,779.62 | 286,286.75 |
| | *සැපයුම්* | | |
| 1503 - 03 - 01 | *ලිපිද්‍රව්‍ය* | 1,364,097.14 | 1,927,809.26 |
| 1503 - 03 - 02 | *ඉන්ධන හා ලිහිසි* | 2,414,071.51 | 2,676,628.99 |
| 1503 - 03 - 03 | *නිල ඇඳුම්* | 40,000.00 | 36,624.00 |
| | *නඩත්තු වි යදම්* | | |
| 1503 - 04 - 01 | *වාහන* | 1,966,101.57 | 1,963,825.42 |
| 1503 - 04 - 02 | *පිරියත, යන්ත්‍ර සහ උපකරණ* | 256,531.85 | 304,962.30 |
| 1503 - 04 - 03 | *ගොඩනැගිල්ල* | 1,535,185.15 | 483,525.45 |
| | *ගිවිසුම්ගත සේවා* | | |
| 1503 - 05 - 02 | *දුරකථන* | 731,205.88 | 578,290.39 |
| 1503 - 05 - 03 | *තැපැල් ගාස්තු* | 155,905.00 | 65,956.50 |
| 1503 - 05 - 04 | *ජලය සහ විදුලිය* | 1,399,546.76 | 1,158,312.88 |
| 1503 - 05 - 05 | *පුවත්පත් සහ සඟරා* | 38,040.00 | 37,748.00 |
| 1503 - 05 - 06 | *ආරක්ෂක සේවා* | 624,133.59 | 659,613.54 |
| 1503 - 05 - 07 | *වෙනත්* | 822,815.58 | 729,973.21 |
| | *එකතුව* | **30,772,839.84** | **27,114,697.69** |

## පළාත් පාලන ආයතන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

## 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂයසඳහා වන

## ගිණුම් සඳහා සටහන්

| ***04*** *සටහන - මානව සම්පත් සංවර්ධන වියදම්* | | | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|---|---|
| ***2201 - 05 - 01*** | *මානව සම්පත් සංවර්ධන වියදම් - ජාතික මට්ටමේ පුහුණු පාඨමාලා* | | ***12,342,807.01*** | ***13,001,989.73*** |
| *2201 - 05 - 01 - 01* | *මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු - මානව සම්පත් අංශය* | | - | - |
| *2201 - 05 - 01 - 02* | *මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු - ඉංජිනේරු අංශය* | | *2,076,876.65* | *1,649,334.87* |
| *2201 - 05 - 01 - 03* | *මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු - පොදු කළමනාකරණ අංශය* | | *1,264,672.43* | *3,212,545.44* |
| | ව්‍යාපෘති කළමනාකරනය පිළිබඳ සහතිකපත් පාඨමාලාව | | *226,333.50* | |
| | පුස්තකාල කළමනාකරණ සහතිකපත් පාඨමාලව | | *372,153.50* | |
| *2201 - 05 - 01 - 04* | *මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු -භෞතික සැලසුම් අංශය* | | *1,607,818.49* | *1,993,281.85* |
| | *ඔටෝකැඩ් මෘදුකාංග භාවිතය පිළිබඳ සහතිකපත් පාඨමාලාව* | | *338,595.00* | |
| *2201 - 05 - 01 - 05* | *මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු මූල්‍ය කළමනාකරණ අංශය* | | *2,532,462.68* | *3,338,530.10* |
| | *පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා පළාත් පාලන මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - 2014* | | *727,934.40* | |
| *2201 - 05 - 01 - 06* | *මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු - නෛතික අංශය* | | *2,186,326.96* | *2,808,297.47* |
| | *මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු - ශාස්ත්‍රීය* | | *16,500.00* | |
| | *පළාත් පාලන නීතිය පිළිබඳ සහතිකපත් පාඨමාලාව -සහන ශාස්තු පාඨමාලාව* | | *993,133.40* | |
| *2201 - 05 - 02* | *මා.ස.සං. වියදම් - පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන්* | | *2,729,048.21* | *849,411.50* |
| | පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව - සිංහල/ දෙමල | | *962,478.00* | |
| | පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමාව - සිංහල/ දෙමල | | *1,471,224.00* | |
| ***2201 - 05 - 03*** | *මා.ස.සං. වියදම් - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ ශක්‍යතා වර්ධනය* | | *1,733,749.15* | *1,730,238.09* |
| ***2201 - 05 - 04*** | *මා.ස.සං. වියදම් - පර්යේෂණ, පුස්තකාල සහ ප්‍රකාශන* | | *2,227,503.85* | *2,561,985.12* |
| ***2201 - 05 - 05*** | *මා.ස.සං. වියදම් - පරිගණක යෙදවුම් පිළිබඳ පාඨමාලාව* | | - . . | *926,031.00* |
| | *එකතුව* | | ***21,466,810.22*** | ***19,069,655.44*** |

## පළාත් පාලන ආයතන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

## 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන

## ගිණුම් සඳහා සටහන්

| **05 සටහන - උපදේශන සේවා වියදම්** | | | | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|---|---|---|
| *1504 - 05* | *වියදම් ගිණුම - පොදු* | | | *1,116,893.79* | *1,271,219.29* |
| *1504 – 13* | *ග්‍රාමීය මාර්ග ව්‍යාප්ත කිරීමේ නියමු ව්‍යාපෘතිය - පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය* | | | - | *2,964,187.07* |
| *1504 – 14* | *සමාජ ඒකාබද්ධතාවය සහ පරිවර්තනය සඳහා වන මුල් පිරිම් වලට පහසුකම් සැලසීම* | | | - | *862,051.50* |
| | *එකතුව* | | | ***2,116,893.79*** | ***5,097,457.86*** |

| **6 සටහන - විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සහ ක්ෂයවීම්** | | | | |
|---|---|---|---|---|
| *2102 - 03* | පාරිතෝෂික | | *1,548,694.00* | *535,967.00* |
| *2102 - 04* | විගණන ගාස්තු | | - | *100,000.00* |
| *2105 - 02* | *ක්ෂයවීම් - යන්ත්‍ර සූත්‍ර හා කාර්යාල උපකරණ* | | *7,916,240.81* | *8,169,170.47* |
| | *එකතුව* | | ***9,464,934.81*** | ***8,805,137.47*** |

## *07 සටහන - දේපල පිරියත  සහ උපකරණ*

| | | 01/01/2013 වන දිනට පිරිවැය | එකතු කිරීම 2014 | ඉවත් කිරීම් 2014 | එකතුව | 2014-01-01 දිනට ක්ෂයවීම් | ක්ෂයවීම් 2014 | ඉවත් කිරීම් 2014 | 2014-12-31 දිනට සමුච්චිත ක්ෂයවීම් | 2014.12.31 දිනට අගය හින වූ වටිනාකම | 2013.03.31 දිනට අගය හින වූ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2201 - 01 | වාහන | 33,824,990.00 | - | 324,990.18 | 33,499,999.82 | 7,806,917.33 | 6,748,748.50 | 315,665 | 14,240,000.83 | 19,259,998.99 | 26,018,072.67 |
| 1 - 02 | යන්ත්‍ර හා කාර්යාල උපකරණ | 4,348,768.38 | 972,746.20 | - | 5,321,514.58 | 2,722,883.69 | 295,132.21 | - | 3,018,015.90 | 2,303,498.68 | 1,625,884.69 |
| 1 - 03 | පුස්තකාල පොත් | 193,593.20 | 102,355.26 | - | 295,948.46 | 153,493.20 | 4,000.00 | - | 157,493.20 | 138,455.26 | 40,100.00 |
| 01-04-01 | ගෘහභාණ්ඩ හා පිරිද්දුම් - කන්ඩලම නිවාඩු නිකේතනය | 213,300.00 | - | - | 213,300.00 | 85,320.00 | 21,330.00 | - | 160,650.00 | 106,650.00 | 127,980.00 |
| | පරිගණක හා පරිගණක උපාංග | 12,858,857.68 | 1,070,956.00 | - | 13,929,813.68 | 9,738,617.08 | 847,030.10 | - | 10,585,647.18 | 3,344,166.50 | 3,120,240.60 |
| | එකතුව | <u>51,439,509.26</u> | <u>2,146,057.46</u> | <u>324,990.18</u> | <u>53,260,576.54</u> | <u>20,507,231.30</u> | <u>7,916,240.81</u> | <u>315,665.00</u> | <u>28,107,807.11</u> | <u>25,152,769.43</u> | <u>30,932,277.96</u> |

8 සටහන - කාරක ප්‍රාග්ධනය

| විස්තරය | 2013-01-01 දිනට පිරිවැය | එකතුකිරීම් 2014 | අඩුකිරීම් 2014 | එකතුව | විස්තරය | 2014-01-01 දිනට ක්ෂයවීම් | ක්ෂයවීම් 2014 | 2014.12.31 දිනට අගය හින වූ වටිනාකම | 2013.03.31 දිනට අගය හින වූ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| නව ඉදිකිරීම් - ගොඩනැගිල්ල | 3,762,415.04 | 40,994,657.21 | - | 44,757,072.25 | - | - | - | 44,757,072.25 | 3,762,415.04 |
| | **3,762,415.04** | **40,994,657.21** | - | **44,757,072.25** | - | - | - | **44,757,072.25** | **3,762,415.04** |

| **9 සටහන - තොග** | | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|---|
| 2202 - 01 | ලිපිද්‍රව්‍ය | 440,457,49 | 317,743.39 |
| 2202 - 02 | ප්‍රකාශන | 1,581,987.90 | 1,536,938.00 |
| 2202 - 03 | ඉන්වෙන්ටරි | 13,250.00 | - |
| | එකතුව | **2,035,695.39** | **1,854,681.39** |

| **10 සටහන - පෙර ගෙවීම් සහ ලැබිය යුතු** | | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|---|
| 2206 - 01 | රක්ෂණ | 125,613.75 | 122,944.10 |
| 2206 - 02 | වෙනත් | 1,077,597.00 | 32,590.00 |
| 2206 - 05 | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 678,259.15 | 525,199.50 |
| | එකතුව | **1,881,469.90** | **680,733.60** |

| **11 සටහන - ණයගැතියෝ සහ අත්තිකාරම්** | | **31.12.2014** | **31.12.2013** |
|---|---|---|---|
| 2203 - 01 | සේවක ණයගැතියෝ | 30,707.42 | 30,707.42 |
| 2203 - 03 | විවිධ ණයගැතියෝ | 32,218.65 | 27,218.65 |
| 2204 - 02 | විශේෂ අත්තිකාරම් | 7,850.00 | 7,850.00 |
| 2204 - 04 | උත්සව අත්තිකාරම් | 31,700.00 | 45,800.00 |
| 2204 - 05 | සේවක ණය | 13,431,574.90 | 13,622,845.98 |
| 2205 - 01 | හදිසි අවස්ථා මිලදීගැනීම් සඳහා අත්තිකාරම් | 123,000.00 | 10,000.00 |
| 2205-03 | ණයට ලබාගැනීම සඳහා අත්තිකාරම් | 77,500.00 | |
| 2205-03 | HRD සඳහා අත්තිකාරම් | 45,000.00 | - |
| 2205-06 | ආනුශංගික කටයුතු සඳහා අත්තිකාරම් | 100,000.00 | - |
| 2207-01 | පරිපාලනය සඳහා අත්තිකාරම් | 10,000.00 | - |
| | එකතුව | **13,889,550.97** | **13,744,422.05** |

| 12 සටහන - මුදල් හා මුදල් සමාන දෑ | | | | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|---|---|---|
| 2207 - 02 | ලංකා බැංකුව ගිණුම් අංක. 2323344 | | | 943,151,31 | 343.573.34 |
| 2207 - 03 | ලංකා බැංකුව ගිණුම් අංක. 2323350 | | | 1,406,058.83 | 223.862.98 |
| 2207 - 04 | ඉතුරුම් ගිණුම් - ලංකා බැංකුව ගිණුම් අංක.. 2329975 | | | 1,646,693.99 | 4.582.37 |
| | එකතුව | | | **3,995,904.13** | **572.018.69** |

| 13 සටහන - විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2014.01.01 වන දිනට ශේෂය | | | 3,690,570.50 | | 3,154,603.50 |
| | කාලපරිච්ඡේදය තුල වෙන් කිරීම් | | | 1,548,694.00 | | 535,967.00 |
| | තථ්‍ය ගෙවීම් | | | - | | - |
| | **2014.12.31** වන දිනට ශේෂය | | | **5,239,264.50** | | **3,690,570.50** |

| 14 සටහන - ණයහිමියෝ සහ උපචිත වියදම් | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2103 - 01 | උපචිත වියදම් | | | 1,855,272.21 | | 2,252,349.26 |
| 2104 - 02 | තැන්පතු - ටෙන්ඩර් | | | 84,250.00 | | 79,250.00 |
| | ලැබූ අරමුදල් - GIZ | | | - | | - |
| | එකතුව | | | **1,939,522.21** | | **2,331,599.26** |

## 8. නිගමනය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය තම ඉලක්ක සහ අභිමතාර්ථ තෘප්තිමත් අන්දමින් සාක්ෂාත් කරගනිමින් 2014 වසරේදී සිය කාර්යභාරය සාර්ථක අන්දමින් ඉටු කිරීමෙහි ලා සමත් වී ඇති බව අපගේ නිගමනයයි.

එහි ප්‍රතිපලයක් වශයෙන් පළාත් පාලන ආයතනවල කාර්යය මණ්ඩලයේ කාර්යසාධනය සහ දැනුම තෘප්තිමත් මට්ටමකට වැඩි දියුණු කරගැනීමට හැකි වී තිබේ.

කෙසේ වුවද, පළාත් පාලන ආයතන සහ පළාත් සභා අනාගතයේදී මුහුණ දෙන අවශ්‍යතාවයන් සපුරාලීමේ ශීඝ්‍රතාවය වර්ධනය කිරීමට මෙන්ම එම ආයනත විසින් අනාගතයේදී මුහුණ දෙනු ඇති අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්යසාධනය තවදුරටත් වර්ධනය කර ගැනීම වුවමනා කරන බව නිරීක්ෂණය කෙරේ.

පළාත් පාලන ආයතනවලට තෝරා පත් කරගනු ලබන සභිකයින්, ඒවායේ සේවය කරන නිලධාරීන් සහ ව්‍යාපාර නියෝජිතයින්ගේ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් නව තාක්ෂණය පවරා දීම සහ කළමනාකරණ පරිචයන් වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන පළාත් මට්ටමින් සිදු කරන පුහුණු ක්‍රියාකාරකම් තවදුරටත් ශක්තිමත් කළ යුතුය යන්න මාගේ නිරික්ෂණයයි.

සඵලදායී පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ උපදේශක සේවා ලබා දීම හරහා පළාත් පාලන ආයතනවල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිතියන් කරා ළඟා වීම සඳහා කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සමග සහයෝගයෙන් ක්‍රියාත්මක වීමට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් කටයුතු කළ යුතුය යන කරුණද නිරීක්ෂණය කරනු ලැබේ.

තවද, පාඨමාලා විෂයමාලාවට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම සඳහා, දැනට පවත්වනු ලබන පාඨමාලා සහ වැඩසටහන් සඳහා සහභාගිවන්නන්ගෙන් ප්‍රතිපෝෂණය ලබාගැනීම පිණිස සුදුසු පරිදි පසු විපරම් ක්‍රියාකාරකම් වල නිරතවීම සුදුසු වන බවද මෙහිදී තවදුරටත් නිරික්ෂණය කෙරේ.

ආයතනය විසින් නිකුත් කරන ප්‍රකාශනයන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා සංස්කාරක මණ්ඩලයේ කාරක සභාව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවද මෙහිදි සඳහන් කරනු ලැබේ.

පරිගණක කුසලතා සහ විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සිදු කරන නව ප්‍රකාශන යනාදිය භාවිතා කරමින් නව දැනුම සහ තාක්ෂණය පවරා දීම හරහා පළාත් පාලන ක්ෂේත්‍රයට සඵලදායී සහ කාර්යක්ෂම සේවාවක් ලබා දීමට ආයතනයේ පුස්තකාලයට හැකියාව ඇති කරනු වස් ආයතනයේ පුස්තකාලය ප්‍රතිසංවිධානය කර සංවර්ධනය කිරීමට කටයුතු කිරීමද අත්‍යවශ්‍ය වේ.

ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සහ එමගින් ලබා දෙන අනෙකුත් සේවාවන් සඳහා වන ඉහළ ඉල්ලුම සලකා බලන කල මෙම වැඩසටහන් සිදුකිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ගොඩනැගිල්ලක් ලබාගැනීමේ අවශ්‍යථාවයද මෙහිදී නිරික්ෂණය කරනු ලැබේ. දැනට මෙම ආයතනය පවත්වා ගෙන යන්නේ පැරණි ගොඩනැගිල්ලක වීම හේතුවෙන් තව දුරටත් ව්‍යාප්ත වීමේ හැකියාව ඉතා සීමිතය. එම නිසා දැනට ගොඩනැගිල්ල පවතින භූමියට යාබද භූමියෙහි නව පස්මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරෙමින් පවතී.

පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවන්නන් මෙන්ම සුදුසු සම්පත්දායකයින්ද ආකර්ෂණය කරගත හැකි වන අන්දමින් ශ්‍රවණාගාරයක්, පුස්තකාලය, ආපනශාලාවක් සහ අනෙකුත් පහසුකම්ද ඇතුළුව අවශ්‍ය කරන සියලුම පහසුකම් වලින් පරිපූර්ණව මෙම නව ගොඩනැගිල්ල ඉදි කිරීමට යෝජනා කර තිබේ.

තවද, ආයතනය සතු වාහන සංචිතයද වර්ධනය කිරීම වුවමනා වේ. දුරස්ථ ප්‍රදේශවල පුහුණු වැඩසටහන් සිදුකිරීමට කටයුතු කිරීම සඳහා මෙය අත්‍යවශ්‍ය සාධකයකි.

පළාත් සභා සහ පළාත් පාලන ආයතන අතර බලය බෙදා හැරීමට අවශ්‍ය කරන පුහුණු වැඩසටහන් සහ වැඩමුළු මෙන්ම එකී ආයතනවල කාර්යසාධනය වැඩි දියුණු කරගැනීම සඳහා අවශ්‍ය වන පුහුණු සහ වැඩමුළුද ඇතුළුව පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල කාර්යක්ෂම සහ සඵලදායී කාර්යසාධනය සඳහා අඛණ්ඩව පහසුකම් සැලසීමට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් කටයුතු කළ යුතු වේ. එම නිසා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනයට කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

ඒ අනුව, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 2014 වසරේදී තම ඉලක්ක සහ අභිමතාර්ථ සාක්ෂාත් කර ගනිමින් තම භූමිකාව සැහෙන සඵලදායී අන්දමට නිරූපනය කර ඇති බව දැනුම් දෙන්නේ හද පිරි සතුටිනි.

කස්තුරි අනුරාධනායක

අධ්‍යක්ෂ

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය